# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සේවක අර්ථසාධක අරමුදල්
## (සංශෝධන)

**1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා විසින් 2011 පෙබරවාරි මස 10 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2010 දෙසැම්බර් මස 13 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[73 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

PL 005506—1,000 (2011/02)

## සේවක අර්ථසාධක අරමුදල්
## (සංශෝධන)

එල්. ඩී.—ඕ. 43/2008.

### 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2011 අංක    දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීම මගින් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

1958 අංක 15 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1අ) (1) වන උපවගන්තිය යටතේ ස්ථාපිත අරමුදලේ යම් සේවා නියුක්තිකයකු සාමාජිකයකු බවට පත්වන අවස්ථාවක කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් නියමිත ආකාරයට එම සේවා නියුක්තයාට සහ සේවා යෝජකයාට හඳුනාගැනීමේ අංකයක් ලබා දිය යුතු ය."

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය මෙයින් ඇතුළත් කිරීමෙන් :—

"(ඉඉ) සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් ලේකම් කාර්යාලයක අරමුදල අයත් වූ හෝ එය විසින් දරනු ලබන හෝ එම කාර්ය සඳහා මිල දී ගන්නා ලද ඉඩමක් මත ඉදිකිරීම සඳහා අවශ්‍ය විය හැකි අරමුදලේ යම් මුදල් ප්‍රමාණයක්, නියම කරනු ලැබිය හැකි නියමයන් හා කොන්දේසි මත, අරමුදලේ ප්‍රයෝජනය සඳහා ආයෝජනය කරනු ලැබිය හැකිවේ." සහ

(2) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ "එම පැවරීමේ දිනට පූර්වයෙන් වූ අවුරුදු හයක කාලයක් නොඉක්මවන පරිදි, එම මුදල්, සහ" යන වචන වෙනුවට "එම මුදල්" යන වචන ආදේශ කිරීමෙන්.

2—PL 005332 — 425 (2010/11)

ප්‍රධාන ප්‍රඥප්තියට 23අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 23අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"නිවාස ප්‍රතිලාභ සහ වෛද්‍ය ප්‍රතිකාරවලට අදාළ ප්‍රතිලාභ."

23අ. (1) (අ) වසර දහයකට නොඅඩු කාලයක් සඳහා අරමුදලට දායක මුදල් ගෙවා ඇති ;

(ආ) දැනට සේවයේ නියුක්තව සිටින ; සහ

(ඇ) ඔහුගේ පෞද්ගලික ගිණුමේ ඔහුගේ බැරට රුපියල් ලක්ෂ තුනකට නොඅඩු මුදලක් ඇති,

අරමුදලේ සෑම සාමාජිකයකුම-

(i) නිවාස කාර්යය සඳහා ; හෝ

(ii) වෛද්‍ය ප්‍රතිකාරවල කාර්යය සඳහා,

ඔහුගේ පෞද්ගලික ගිණුමේ ඔහුගේ බැරට ඇති මුදලින් සියයට තිහක් නොඉක්මවන ප්‍රතිශතයක් ආපසු ලබා ගැනීමට හිමිකම ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව ඔහුගේ ගිණුමේ, ඔහුගේ බැරට ඇති මුදලින් යම් මුදලක් ආපසු ලබා ගන්නා අරමුදලේ සාමාජිකයකුට, එසේ ආපසු ලබා ගැනීමේ දින සිට අවුරුදු දහයක කාල සීමාවක් සම්පූර්ණ වීමෙන් පසු (1) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල විධිවිධානවලට යටත්ව එකී ගිණුමෙන් දෙවන වරට සියයට තිහක ප්‍රතිශතයක් නොඉක්මවන මුදලක් ඉහත කාර්යවලින් යම් කාර්යයක් සඳහා ආපසු ලබාගැනීමට හිමිකමක් ඇත්තේ ය.

(3) සෑම සාමාජිකයකුට ම අරමුදලේ දායකයකු වශයෙන් සිටින කාලය තුළ දී තම පෞද්ගලික ගිණුමෙන් අවස්ථා දෙකක දී පමණක් මුදල් ආපසු ලබා ගැනීමට හිමිකම ඇත්තේ ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා—

"නිවාස" යන්නට, ඒ සාමාජිකයා විසින් —

(අ) සාමාජිකයාට අයත් ඉඩමක නිවසක් ඉදිකිරීම;

(ආ) නිවාසයක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිල දී ගැනීම ;

(ඇ) නිවාස දේපළක් මිල දී ගැනීම ;

(ඈ) නිවාස දේපළක් මත ඇති උකසක් බේරුම් කිරීම ; හෝ

(ඉ) අනුමත බැංකුවකින් ලබාගත් නිවාස ණයක ඉතිරි මුදල බේරුම් කිරීම,

ඇතුළත් වේ. සහ

"වෛද්‍ය ප්‍රතිකාර" යන්නට—

(අ) හෘදය සැත්කම ;

(ආ) බයිපාස් සැත්කම ;

(ඇ) සැත්කම් ඇතුළුව පිළිකා සඳහා ප්‍රතිකාර ;

(ඈ) වකුගඩු බද්ධ කිරීම හෝ සැත්කම් ;

(ඉ) සිසේරියන් සැත්කම ; හෝ

(ඊ) අනතුරක් සිදුවීම හේතු කොටගෙන දින දාහතරකට නොඅඩු කාලයක් රෝහල් ගතව සිටීම,

ඇතුළත් වේ.

(5) මේ වගන්තියේ සඳහන් වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා අරමුදලේ සාමාජිකයාට ඔහුගේ හෝ ඇයගේ කලත්‍රයාට සහ ඔහුගේ හෝ ඇයගේ දරුවන්ට හිමිකම් ඇත්තේ ය.

(6) (1) වන උපවගන්තියේ (i) වන හෝ (ii) වන අනුඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු එකිනෙකට වෙනස් දින අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන යම් නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 24අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 24අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

“රක්ෂණ හෝ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය”

24අ. (1) අරමුදලේ සාමාජිකයන්ගේ යහපත උදෙසා කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ නියමයන් සහ කොන්දේසිවලට යටත්ව, අවස්ථාවෝචිත පරිදි, හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයක් සහ රක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) රක්ෂණ හෝ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට හෝ එම යෝජනා ක්‍රම දෙකටම හෝ බැඳීමට කැමති අරමුදලේ සෑම සාමාජිකයෙක්ම නියමිත මුදල් දායක මුදල් වශයෙන් ගෙවිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31අ වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31අ වගන්තියේ, “සියයට එකක අනුපාතිකයට” යන වචන වෙනුවට “සියයට දෙකක අනුපාතිකයට” යන වචන ආදේශ කිරීමෙන් එකී වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 31ආ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය එම ප්‍රඥප්තියේ 31ආ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

“වාර්තා ඉදිරිපත් කිරීමට ඇති කාර්යභාරය”

31ආ. අවම වශයෙන් සේවා නියුක්තයන් පනහක් ඔහුගේ සේවයේ නියුක්තව සිටින සෑම සේවා යෝජකයකු විසින් ම එම මාසයට පසුව එළඹෙන මාසයේ අවසානයට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවට පිටපතක් සහිතව නියම කරනු ලබන විස්තර ඇතුළත් මාසික වාර්තාවක් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ “රුපියල් දහසක් දඩයකට නොඉක්මවන”, “මාස හයක් නොඉක්මවන” සහ “එක් එක් දිනය සඳහා රුපියල් පනහක් නොඉක්මවන දඩයකට” යන වචන වෙනුවට අනුපිළිවෙලින් “රුපියල් විසි දහසක් නොඉක්මවන දඩයකට”, “මාස දොළහක් නොඉක්මවන ” සහ “එක් එක් දිනය සඳහා රුපියල් දෙසීයක් නොඉක්මවන දඩයකයට” යන වචන ආදේශ කිරීමෙන් එකී වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ග) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

> “(ගග) නිවාස ප්‍රතිලාභ සහ වෛද්‍ය ප්‍රතිකාරවලට අදාළ ප්‍රතිලාභ ප්‍රදානය කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ;” .

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**10.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.